# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

**අංක 2147/57 - 2019 ඔක්තෝබර් මස 30 වැනි බදාදා - 2019.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2063/37 හා 2018.03.22 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 2A හා 3A පිටුවල ප්‍රකාශයට පත් කරන ලද නියමයේ උපලේඛනයේ ඉඩමේ නම බදුලුකැලේ ලෙස සඳහන් වුවත්, එය උඩහේන ලෙසත්, ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.0668 (පර්චස් 26.41)ක් ලෙස සඳහන් වුවත් එය හෙක්ටයාර් 0.0763 (පර්චස් 30.17) ක් ලෙසත්, ඉඩමට හිමිකම් පාන්නන්ගේ නම සහ ලිපිනය බී. කහදගමගේ මහතා - මැදවත්තහේන, කිතලගම මධ්‍යම, තිහගොඩ ලෙස සඳහන් වුවත් එය ලියන මුදියන්සේලාගේ තිලකසිරි මහතා, අංක 3 හේනපාවුල ගෙදර, කිතලගම නැගෙනහිර තිහගොඩ ලෙසත් ඉඩමට අදාළ මායිම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද අංක MR/THG/2017/462 දරන ප්‍රගමන අනුරේඛනයෙහි දැක්වෙන පරිදි පහත සඳහන් ලෙස නිවැරදි විය යුතු බවත්, මෙයින් ප්‍රකාශයට පත් කරමි.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක A, බැස්ටියන් කහදගමගේ හිමිකම් කියන මැදවත්ත හේන සහ කමල් රාමනායක හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | කමල් රාමනායක හිමිකම් කියන ඉඩම සහ ලියන මුදියන්සේලාගේ තිලකසිරි හිමිකම් කියන උඩහේන ; |
| *දකුණට* | : | ලියන මුදියන්සේලාගේ තිලකසිරි හිමිකම් කියන උඩහේන සහ මාර්ගය ; |
| *බටහිරට* | : | මාර්ගය සහ කැබලි අංක A. |

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
''ලක්දිය මැදුර'',
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1328

11 - 1047

1A - G 31378 — 50 (2019/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇහැලියගොඩ නව ජල ව්‍යාපෘතියේ ජල පිරිපහදු ඒකකය සඳහා අතිරේක ඉඩමක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
''ලක්දිය මැදුර'',
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1521

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 124C ගලබලන කන්ද ග්‍රාම නිලධාරි වසමේ මානියංගම ගමේ පිහිටි, කොබතුරාවත්ත නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් බලයලත් මිනින්දෝරු A වෙලගෙදර මහතා විසින් සකස් කරන ලද සැලසුම් අංක 4041 හි දැක්වෙන අක්කර 1 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පුද්ගලික ප්‍රවේශ මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| *බටහිරට* | : | පුද්ගලික ප්‍රවේශ මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. කේ. ජී. පාලිත ප්‍රේමසිරි මයා,
පහල නාගොඩ,
හිරිකුඹුර පාර,
ගැටහැත්ත.

11 - 1048

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට හෙම්මාතගම ජල ව්‍යාපෘතියේ ජල ගබඩා ටැංකිය හා ඒ වෙත දිවෙන ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩමක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 24 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
''ලක්දිය මැදුර'',
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1527

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44C, තල්ගස්පිටිය මුස්ලිම්ගම වසම තල්ගස්පිටිය පණපුරේ ගමේ පිහිටි අඹදෙණිය වතුයායේ පණපුරේ කොටස නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 14 ක් පමණ වන බලයලත් මිනින්දෝරු එම්. එස්. එම්. අජ්වාඩ් මහතා විසින් සකස් කරන ලද පිඹුරු අංක 11711 පිඹුරෙහි දැක්වෙන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : පාර ;
*නැගෙනහිරට* : 281, පිඹුරේ කැබලි අංක 38 ;
*දකුණට* : බලයලත් මිනින්දෝරු ෂොක්මන් මහතාගේ පිඹුරු අංක 480 හි කැබලි අංක 11C ;
*බටහිරට* : 281 පිඹුරේ කැබලි අංක 01 හි ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : එච්. එම්. අයිෂා සෙයිලානියා,
අංක 225,
කාසල් වීදිය,
බොරැල්ල,
කොළඹ 08.

11 - 1049